# තනතුරු ඇබෑර්තු

වයඹ පළාත තුළ මූල්‍ය ක්ෂේත්‍රයේ කටයුතුවල නියැලී සිටින ද්විතිය මට්ටමේ සමුපකාර සංවිධානයක් වන, සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය සඳහා දැනට භාවිතා කරන මෘදුකාංග ඒකාබද්ධ කර සංවර්ධනය කිරීම හෝ නව මෘදුකාංගයක් නිර්මාණය කිරීම වෙනුවෙන් පිරිවිතරයක් (SRS) සැකසීම හා උපදේශන සේවා සපයා ගැනීමේ අරමුණින් පහත සඳහන් තනතුර සඳහා මතු දැක්වෙන සුදුසුකම් සපුරා ඇති, අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## උපදේශක තනතුර
## බැංකු මෘදුකාංග ඒකාබද්ධ කිරීම සහ පිරිවිතරයන් (SRS) සැකසීම.
**- කොන්ත්‍රාත් පදනමින් -**

**අරමුණු :**

- දැනට පවතින පද්ධති (MBwin & Quick Book) නිවැරදිව ඒකාබද්ධ කිරීම.
- ඒකාබද්ධ කිරීම සඳහා SRS (Software Requirement Specification) සකස් කිරීම.
- දත්ත කළමනාකරණය , වාර්තාකරණය මත නියාමනය සඳහා මධ්‍යස්ථ වේදිකාවක් නිර්මාණය කිරීම.
- පළාත සහ ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කළ හැකි සහ ව්‍යාප්ත කළ හැකි විසඳුමක් නිර්මාණය කිරීම.

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

- පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, මෘදුකාංග ඉංජිනේරු, කළමනාකරණ තොරතුරු පද්ධති සම්බන්ධ ක්ෂේත්‍රයක විද්‍යාවේදී විශේෂ හෝ ශාස්ත්‍රපති උපාධිය.
- බැංකු මෘදුකාංග ERP හෝ මූල්‍ය පද්ධති සම්බන්ධ අමතර සහතික පත්‍ර ලබා තිබීම.
- මූලික බැංකු පද්ධති (MBwin හෝ සමාන) පිළිබඳ පළපුරුද්ද.
- ගිණුම්කරණ මෘදුකාංග (QuickBooks හෝ සමාන) පිළිබඳ දක්ෂතාව.
- ග්‍රාමීය බැංකු/බැංකු මෘදුකාංග සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා නියැලුම් කිරීමේ පළපුරුද්ද. API, Middlware හෝ විශේෂිත විසඳුම් මගින් පද්ධති ඒකාබද්ධ කිරීම.
- දත්ත ගබඩා කළමනාකරණය (SQL, Server, Oracle හෝ වෙනත් සම්බන්ධ දත්ත ගබඩා).
- මූල්‍ය දත්ත ආරක්ෂාව, සංකේතාංකනය, ISO27001 අනුකූලතාව පිළිබඳ දැනුම.
- Cloud deployment සහ මධ්‍යස්ථ පද්ධති දැනුවත් බව.

වෘත්තිය පළපුරුද්ද

- මූල්‍ය ආයතන සඳහා IT උපදේශනයේ අවම වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්ද.
- මූලික බැංකු මෘදුකාංග ක්‍රියාත්මක කිරීම හෝ ඒකාබද්ධ කිරීමේ ප්‍රායෝගික අත්දැකීම් ලබා තිබීම.
- දේශීය බැංකු සඳහා මෘදුකාංග සංවර්ධනයේ අත්දැකීම් ලබා තිබීම.
- සම්පූර්ණ බැංකු පද්ධති ව්‍යාපෘතියක් සාර්ථකව ක්‍රියාත්මක කර තිබීම.

වෙනත් සුදුසුකම්

- අවශ්‍යතා විශ්ලේෂණ, සැලසුම් කිරීම සහ අවදානම් කළමනාකරණය.
- ශක්තිමත් ලේඛන සහ වාර්තාකරණ කුසලතා.
- සේවකයින් සහ අවසාන පරිශීලකයින් සඳහා පුහුණුව හා සහයෝගය ලබාදීමේ හැකියාව.

❖ වැටුප් / ගාස්තු හා දීමනා - සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී සාකච්ඡා කර තීරණයකට එළඹිය හැක.

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති උපදේශකවරුන් තමා විසින්ම පිළියෙල කරගත් අයදුම් පත් තම ලිපිනයැති 9 x 4 ප්‍රමාණයේ මුද්දර ඇලවූ ලියුම් කවරයක් ද සමඟ 2026.03.20 දින ප.ව. 12.00 ට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල තනතුරු නාමය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය. අවසන් දිනෙන් පසුව ලැබෙන හා ඉල්ලුම්කර ඇති තොරතුරු රහිත ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2026.02.23

WCRB

ගරු සභාපති,

**සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය**

ග්‍රාමීය බැංකු මන්දිරය, 107, දඹුල්ල පාර, කුරුණෑගල.

දුරකථන : 037-2226192 ෆැක්ස් : 037-2234153